# ප්‍රජා සංවර්ධන කාර්යයෙහි ගුරුවරයා සතු භූමිකාව

(බෙන්තර - ඇල්පිටිය මන්ත්‍රී කොට්ඨාශය

ඇසුරෙන් කරන ලද අධ්‍යයනයකි)

පී. ප්‍රේමදාස (එම්. ෆිල්. 72)

කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පීඨය මගින්

1983 වර්ෂයෙහි පැවැත් වූ අධ්‍යාපන දර්ශනපති

පරීක්ෂණයේ අවශ්‍යතාවයන් අර්ධ වශයෙන් සම්පූර්ණ

කිරීම සඳහා කරන ලද නිබන්ධයකි

UCLIB
414772
Class No.
Acc. No.

අධ්‍යාපන පීඨය,

කොළඹ විශ්ව විද්‍යාලය,

1988 අගෝස්තු

CR
414772
CR

# පර්යේෂණ සංක්ෂිප්තය

පසුගිය දශක කීපය තුළ අධ්‍යාපනය අදාළ ප්‍රජා සේවාවන් වෙනුවෙන් යෙදූ ජාතික සම්පත්වලට ප්‍රමාණාත්මක ව ග්‍රාමීය සමාජයේ බහුතර, පහළ ස්ථරයේ ජීවන තත්වය දියුණු නොවූ බව ගුරුවරයකු වශයෙන් එම ප්‍රදේශවල දීර්ඝ කාලයක් සේවය කිරීමෙන් ලද අත්දැකීම කෙරෙන් පැහැදිලි වීමත් ප්‍රජා සංවර්ධන කාරකයන් වශයෙන් පාසල හා ගුරුවරයා සතු වගකීම හා ශක්තියට ද, සමාජ ප්‍රාර්ථනාවන්ට ද සරිලන අයුරින් අධ්‍යාපන ක්‍රමයෙහි සංවර්ධනාත්මක එළඹුමක් අවශ්‍ය බව පෙනී යාමත් (දැනට සේවයේ නියුතු, බෙන්තර - ඇල්පිටිය මන්ත්‍රී කොට්ඨාශය ආශ්‍රයෙන්) මෙම අධ්‍යයනය කිරීමට පෙළඹුණි.

ප්‍රජා සංවර්ධන කටයුතු කෙරෙහි ගුරු ආකල්පය හා සහභාගීත්වය පරීක්ෂා කිරීමත්, ප්‍රජාවගේ ස්ව ශක්තිය, සාමූහිකත්වය ද, රජයේ හා ස්වේච්ඡා සංවිධානවල ක්‍රියාකාරීත්වය ද, ගුරුවරයා සතු පෙළඹවීමේ හැකියාව හා විශේෂ දක්ෂතාවන් ද උපයෝගී කොට ගෙන, ආසන්න ප්‍රජාව උදෙසා සමෝධානිත සංවර්ධනාත්මක වැඩ සටහන් පාසල කේන්ද්‍ර කොට ගෙන ක්‍රියාත්මක කළ හැකි දැයි විමසා බැලීම පර්යේෂණයේ අරමුණ විය.

කොට්ඨාශයෙන් අහඹු ලෙස තෝරා ගත් පාසල් 32 කට අයත් ගුරු නියැදිය ප්‍රශ්නාවලියකින් ද, රජයේ හා ස්වේච්ඡා සංවිධානවල 199 ක් පමණ වන නිලධාරී නියැදිය, කේවල හා කණ්ඩායම් සම්මුඛ සාකච්ඡාවන්ගෙන් ද, සූක්ෂම සමීක්ෂණයට භාජනය කළ පිරිස්වත්ත ග්‍රාම සේවක කොට්ඨාශයේ පවුල් ඒකක 400 ක් පමණ නිරීක්ෂණයෙන් හා සම්මුඛ සාකච්ඡාවන්ගෙන් ද පරීක්ෂා කොට අවශ්‍ය දත්ත ලබාගෙන අදාළ ආයතනවල වාර්තා ගත විස්තර හා පර්යේෂණ සාහිත්‍යය ද ආධාර කොට ගෙන පර්යේෂණ පැවැත්විය.

ආත්මාවබෝධය හා සාමූහිකත්වය පන ගැන්වීමටත්, ජනතාව ප්‍රෝත්සාහි කළ හැකි, ඔවුන්ගෙන් ම පැනනැගෙන නව නායකත්වයක් ග්‍රාමීය ප්‍රජාවන් සංවර්ධනය සඳහා අවශ්‍ය බව අධ්‍යයනයෙන් තවදුරටත් තහවුරු විය. පාසල් පරිපාලනයේ හා සංවිධානයේ විමධ්‍යගත වීමක් ද, ප්‍රජා කේන්ද්‍රිය විෂය කොටසමුයන් හා ඉගෙනුම්-ඉගැන්නුම් ක්‍රියාවලියක් ද සංවර්ධනය කළ යුතු බව පෙනේ. ඒ සඳහා පිරිප්වත්ත ග්‍රාම සේවක කොට්ඨාශය පාසලේ ආසන්න ප්‍රජාව වශයෙන් ගෙන, සමෝධානිත ප්‍රජා සංවර්ධන සැළැස්මක් පිළියෙළ කොට ඊට උචිත පාසල් වැඩ සටහනක් ද යෝජනා කරන්නට යෙදුනි.

==========